3

# සීහළවත්ථුප්පකරණය තුළින් හෙළිවන ඓතිහාසික ශ්‍රී ලාංකේය ජනසමාජයේ පැවති ශිල්පකලා

දුල්මා කරුණාරත්න

ශ්‍රී ලාංකේය මානවයා ස්වකීය දෛනික ජීවිතයේ ක්‍රියාකාරකම්, උත්සව සහ අභිචාර ආදී නේකවිධ කටයුතු උදෙසා ශිල්පකලාවන් යොදා ගැනීමේ ඉතිහාසය වසර දහස් ගණනක් ඈතට දිවයයි. මෙසෝලිතික යුගයේදී පාශාන සට්ටනයෙන් තම දිවිපෙවෙතට සහයවූ ශිලාමෙවලම් නිමවාගත් ඔවූහු, ප්‍රොටෝ ඓතිහාසික යුගයේදී ප්‍රගුණ කරන්නාවූ යකඩ තාක්‍ෂණය සමග තවත් බොහෝ ශිල්පයන් රැසක අත්දැකීම සහ විධිමත්භාවිතය වෙත යන්නට අවැසි විශේෂ ප්‍රාගුණ්‍යතාව ප්‍රකට කරන ලදී.

ශ්‍රී ලංකාවේ ඉතිහාසය පෙළගස්වන්නෙකුගේ පරිහරණය සඳහා, ශිල්පකලාවන්ගේ අතීත ඉසව් සහ එහි ස්වභාවය සොයාගැනීමට අවැසි පුරාවිද්‍යා මූලාශ්‍ර සැලකිය යුතු ප්‍රමාණයක් ශේෂවී ඇත. ඓතිහාසික සමයේ උදාවත් සමග වර්ධනය වන ලාංකේය සමාජයේ ශිල්පකලාවන්හි උපයෝගිතාව එකල ඉදිරිපත්ව ඇති පූර්වබ්‍රාහ්මී ශිලාලේඛනයන්ගෙන් මෙන්ම, පුරාවිද්‍යා කැණීම් ඔස්සේ හමුවී ඇති නිමි භාණ්ඩ, අමුද්‍රව්‍ය සහ ක්‍රමවේදයේ මතක සටහන් මෙලෙස ද්‍රව්‍යාත්මක ශේෂ ලෙස හමුවී හමාරය (Coomaraswamy 1908). යාපන අර්ධද්වීපයේ කන්තරෝදයේ සිට දකුණේ තිස්සමහාරාමයේත්, මාන්තායි සිට නැගෙණහිරින් සේරුවිලත් අනුරාධපුරයට සමාන්තරව මෙම ශිල්පයන්ගේ පැවැත්ම පිළිබඳ ජීවමාන සාධක අපවෙත ඉදිරිපත් කර ඇත. මෙම ශිල්පයන් ශ්‍රී ලංකාව වෙත සම්ප්‍රාප්තිය හා බැඳි භාරතීය සබඳතාව, ශිල්ප පවුල්, ඒ එකිනෙක වෙත පැවරුණ කාර්යභාරයන් සහ සේවා පිළිබඳ *මහාවංසය, දීපවංසය* හා *බෝධිවංසය* ඇතුළත් වූ

ඓතිහාසික සාහිත්‍ය මූලාශ්‍ර සපයනුයේද නොමඳ වූ ආලෝකයකි (Coomaraswamy 1908). මෙවන් බහුතරයක් වූ මහා සම්ප්‍රදායේ මූලාශ්‍ර අතර ජන සාහිත්‍ය මූලාශ්‍රයක්වන පාලි *සීහළවත්ථුප්පකරණය,* මෙකී ශිල්පකලාවන්ගේ සමගාමී මෙන්ම දුලබ පැතිකඩ අනාවරණය කරගැනීමේ කථාන්තරය සැලකිය යුතු මට්ටමකින් ඔපවත් කරයි.

*සීහළවත්ථුප්පකරණයේ* රචනාකාලය පිළිබඳ විමසාබැලීමේදී එය බොහෝ විවාදාපන්න අදහස් කිහිපයකින් සමන්විත වුවද මෙහි අන්තර්ගතය පිරික්සීමෙන් දළ අදහසකට පිවිසෙන්නට පිළිවන. *සීහළවත්ථුප්පකරණය,'ඉතා පැරණි සිංහල බණකථා'* ලෙසින් සිංහල බසට පරිවර්තනය කරන පොල්වත්තේ බුද්ධදත්ත හිමි ස්වකීය ප්‍රස්තාවනාවේ මෙහි රචනාකාලය සද්ධාතිස්ස රජතුමාට ආසන්න කාලයක් ලෙස මතුකර දක්වයි (සීහළවත්ථුප්පකරණං 1959:VII-III). මෙහි එන බොහෝ කථාන්තර සමග සම්බන්ධ කරන රාජකීය චරිතය ලෙස කැපීපෙනෙනුයේ සද්ධාතිස්ස රජු වීම මෙම මතයට බොහෝදුරට පාදක වූවා විය හැකිය. එහෙත් විවිධ කාලයන්හි බණ කථා ලෙසින් පැවතී ඇති නිසාවෙන් ඒ ඒ සමාජ සන්ධර්භයන්හිදී යම් සංස්කරණයන්ට මෙම කෘතිය බඳුන් නොවූවා යයි කීමට ද නොහැකිය. මහා වංසය වැනි මහා සම්ප්‍රදායේ කෘතියක් නොකියවෙන චූල ජනසමාජයන්හි පුරාතත්ත්වයන් ස්පර්ෂ කරන්නාවූ කතාන්තර ගනනාවක් මෙකී කෘතිය හරහා එළි දකින නිසාවෙන් මෙන්ම මෙය එවැනි බණ කතාන්තර ග්‍රන්ථාවලියක ඇරඹුම සනිටුහන් කරයි. *සහස්සවත්ථුප්පකරණය* සහ *රසවාහිනී* වැනි පාලි ග්‍රන්ථ මෙන්ම *සද්ධර්මාලංකාරය* වැනි සිංහල බසින් ලියවෙන ග්‍රන්ථ මේ සම්ප්‍රදායේ දීර්ඝ කාලීන ප්‍රතිඵලයෝ වෙත්. එකම සම්ප්‍රදායක වූ මෙම ග්‍රන්ථ සියුම් ලෙස පරීක්ෂා කළ විට කාලය සහ අවකාශය අතර ජනජීවිතයේ සිදුවන සියුම් දෝලනයන් පරාවර්තනය කරන්නාවූ ඓතිහාසික සටහන් ලෙස අරුත් ගැන්විය හැකිය. විටෙක එකම කතාන්තරය ග්‍රන්ථ කිහිපයක ලියවෙන අතරම මදක් වෙනස් වන්නාවූ මෙන්ම මෙම ආරයටම ලියවුණු වෙනස්ම කතාන්තරවලින් පොහොසත් මෙම ග්‍රන්ථ සම්ප්‍රදාය මහාසම්ප්‍රදාය විසින් සගවණු ලැබූ නොයවුණු මිනිසුන්ගේ ඉතිහාසයේ ඉසව් සොයා යන්නෙකුට මග සළකුණු ගෙනහැර පායි.


*සීහළවත්ථුප්පකරණයරචනා* කරන ලද්දේ කණ්ටකසෝල පටුනේ උපන් පට්ටකොට්ටි විහාරයේ විසූ ආචාර්ය ධම්මනන්දි තෙරුන් විසින් බව මෙහි සෑම පරිච්ඡේදයක් අවසානයේදීම කතුවරයා සනාථ කරයි.[1]දළවශයෙන් ක්‍රිස්තු පූර්ව 1 - ක්‍රිස්තු වර්ෂ 2 කාලපරාසයක් වෙත සන්දර්භගතකරන *සීහළවත්ථුප්පකරණය* උක්ත

---

[1]*... ඉති කණ්ටකසොලපට්ටනවත්ථබ්බෙන පට්ටකොට්ටි විහාරවාසිකෙන ආචරියධම්මනන්දිත්ථෙරෙන කතං සීහළවත්ථු දසකං නිට්ඨිතං...* (සීහළත්ථුප්පකරණං 1959: කථාවස්තුව 8, පි.35)

සමයේ ශිල්පකලාවන්ගේ විවිධ පරාසයන් අපවෙත ගෙන එන අයුරු මෙමගින් විශ්ලේෂණයට බඳුන් කෙරේ.

*සීහලවත්ථුප්පකරණයේ* කතාන්තර විඛණ්ඩනය කිරීම මගින් බණකථා ලෙස ඉදිරිපත්වන මේවායේ මුසුව ඇති ඓතිහාසික යුගයේ ජනජීවිතය හා බැඳි ශිල්ප කර්මාන්තයන් කිහිපයක් මූලික වශයෙන් හඳුනාගත හැකිය. සෙසු සාහිත්‍ය සහ පුරාවිද්‍යා මූලාශ්‍ර මගින් හෙළිදරව්වන්නා සේම ලෝහ කර්මාන්තය පිළිබඳව සැලකියයුතු දත්ත ප්‍රමාණයක් මෙම ග්‍රන්ථයේ ද අන්තර්ගතය. එහිදී ලෝහ තාක්‍ෂණය යටතට ගැනෙන පහත දැක්වෙන මාධ්‍ය මෙම කතාන්තර තුළ ඉදිරිපත් වේ.




මෙම කර්මාන්ත අතරින්ද යකඩ කර්මාන්තය පිළිබඳ වැඩි අවස්ථා ගණනකදී තොරතුරු සටහන්ව තිබීම පොදු ජන සමාජයේ සුලභව භාවිත ලෝහ මාධ්‍යයක් ලෙස යකඩ භාවිතය ඉදිරියෙන් පැවති බැව් කියාපානු ලබයි. තඹ, රිදී සහ පිත්තල කර්මාන්තයන්ගේ වගතුග ද සටහන්වත්දී රත්‍රන් (*සුවණ්ණ*) රාජකීය පැලැන්තියේ සුඛෝපභෝගී මෙවලම් සහ ආගමික පූජ්‍යවස්තු නිර්මාණකරණයේ ඉහළ ඉල්ලුමක් පැවති ශිල්පකලාවන් ලෙස මෙහි අන්තර්ගත කරුණු ඔස්සේ අනාවරණය කරගත හැකිය. රාජකීය මෙවළම් නිර්මාණය සහ රත්‍රන් භාවිතය ඔවන්ගේ ආර්ථික ශක්තිය මෙන්ම සමාජමය වශයෙන් පරිහරණය සඳහා වූ අයිතිය කියාපන්නක් බඳුය. කුඹල් කර්මාන්තය මින් අනතුරුව විස්තර සහිතව දක්වන කර්මාන්තයක් ලෙස හඳුනාගත හැකි අතර මීට අමතරව මැණික්, දැව, තූර්යභාණ්ඩ, රෙදිපිළි මෙකල සමාජයේ ශිල්පීන් විසින් ප්‍රගුණ කරන ලද ශිල්පකලාවන් වූ බව *සීහලවත්ථුප්පකරණය* තුළින් සනාථ වේ.

විවිධ ශිල්පකර්මාන්ත වර්ගයන්ට අමතරව ශිල්පගම්මාන කිහිපයක් පිළිබඳ තොරතුරු ද මෙම ග්‍රන්ථය තුළ අන්තර්ගතව ඇත. මෙය අතීත ලංකාවේ සාම්ප්‍රදායික ශිල්ප ගම්මානයන්හි ස්ථානගතවීම සොයායන්නෙකුට සිතියමක් සපයයි. ඒ අතර කුඹල් ගම් (*කුම්භකාරස්සගාමකෙ*) (*සීහලවත්ථුප්පකරණං* 1959: කථාවස්තුව 3 පි.12), කිණිහිරිගම (*කණ්ණිකාරකගාමකෙ*) (එම) තඹ (*තම්මණකාරකගාමකෙ*) (එම) යනාදී ගම්මාන ලෝහ කර්මාන්තය පිළිබඳ

ශිල්පීන්ගේ ඒකරාශීවීම් පිළිබඳ සාධක සපයයි. කිණිහිරය යන්න ලෝහ කර්මාන්තයේ උපයුක්ත මෙවලමක් ලෙස ප්‍රකටය. *මහාවංසය* ද මෙවැනි කුඹල්ගම් රාශියක් පිළිබඳ තොරතුරු අපවෙත අවස්ථාකිහිපයකදී ගෙනහැර පායි (*මහාවංසය,* 1967: පරි. 15 ගාථා 200-201). *තම්මන, තම්බායේ* වැනි ප්‍රදේශ තඹකර්මාන්තය පිළිබඳ තෙරතුරු සැපයීම *මහාවංසය, ධාතුවංසය* සහ පුරාවිද්‍යා කැණීම් තුළින් සේරුවිල පිළිබඳ සැපයූ නිදර්ශන (Seneviratne 1995) සිහිගන්වනසුළු සටහන්වේ.

අතීත ලක්දිව ශිල්ප ගම්මාන නාමකරණයේදී ඒ ඒ ගම්මානයන්හි සිදුකෙරෙන කර්මාන්තය සහ සබැඳියාවක් දක්වන අතරම නම ඇසූ පමණින් එහි මතුපිට අරුතම කර්මාන්තය පිළිබඳ ඉඟි සපයයි. ඒ අයුරින් ඉහත ගම්මාන, කර්මාන්තයේ නාමය සමග සෘජුව සම්බන්ධවන ග්‍රාම නාමවන අතර එසේ නාමික සබඳතාවක් රහිත ගම්මාන කිහිපයක්ද *සීහලවත්‍ථුප්පකරණය* තුළ අන්තර්ගතව ඇත. අනුරාධපුරයේ පිහිටි ලෝකුරු ගම් හා කුඹල්ගම්, කඩු මිටි සෑදීම සිදුකළ *වාමනද්දි* නම් ගම (*සීහලවත්‍ථුප්පකරණං* 1959: කථාවස්තුව 18, පි.55) රන්කරුවන් විසූ රුහුණේ *මහානාම* ගම (එම, කථාවස්තුව 40, පි.107) නිදසුන් ලෙස පෙන්වා දීමට පුළුවන. අනුරාධපුරය සහ මාගම ඓතිහාසික යුගයේ යකඩ තාක්‍ෂණය ඇතුළු විවිධ ශිල්පකලාවන්ගේ උපයෝගිතාව ලත් නාගරික ප්‍රදේශ සහ වෙළෙඳ මධ්‍යස්ථාන වීම ඒ අවට ශිල්ප ගම්මාන ස්ථානගතවීමට ප්‍රවනතාවක් ලෙස හඳුනාගත හැකිය. ඒ සඳහා *සීහලවත්‍ථුප්පකරණය* මෙලෙස සාක්ෂි සපයයි.

විවිධ කර්මාන්තයන්හි නිරතවූ ශිල්පීන් හැඳින්වූ නම් කිහිපයක්ද *සීහලවත්‍ථුප්පකරණය* තුළ අන්තර්ගත වේ.

සන්නාලියන් - *තුන්නවායො* (*සීහලවත්‍ථුප්පකරණං,* 1959: කථාවස්තුව 11පි.)
ලෝකුරුවන් - කම්මාරො (එම. කථාවස්තුව 40, පි.107)
ගඩොල් කපන්නන් - *ඉට්ඨකම්මෙන* (එම, කථාවස්තුව 45, පි. 121)
තූර්යභාණ්ඩ සාදන්නන් -ගන්ධබ්බො (එම, කථාවස්තුව 4, පි. 15)
කුඹල්කරුවන් -කුම්භකාරො (එම)

රාජකීය අවශ්‍යතා උදෙසා රාජකීය ශිල්පීන් සිටි අතර ඒ අය රජවාසලට ගෙන්වා, තම අවශ්‍යතාව පවසා, භාණ්ඩ සාදන ලෙස අණකිරීම සහ විටෙක අමුද්‍රව්‍ය ලබාදී භාණ්ඩ නිර්මාණය කර ගැනීම පිළිබඳ තොරතුරු සඳහන් වේ. රන්කරුවෙකුට රත්‍රන් ලබාදී රන්තලියක් සකසා ගැනීමේ සිදුවීමක් [2]

[2] "*රාජා තං ආහරාපෙත්වා සුවණ්ණං තස්ස දාපයී*
*ඉමං සුවණ්ණං කොට්ටෙත්වා ථාලං මය්හං කරොහි භො...*" (*සීහලවත්‍ථුප්පකරණං,* 1959: කථාවස්තුව 40, පි. 107)

*සීහළවත්ථුප්පකරණයේ* නිදර්ශිතය. මෙම සිදුවීම අපට මහනුවර රජවාසල ඇසුරේ ක්‍රියාත්මක වූ රාජකාරි ක්‍රමය තුළ ඇතුළත්වූ විශේෂ ප්‍රාගුණ්‍යයෙන් යුත් රාජකීය කාර්මික ශිල්පීන්ගේ සේවාවන්හි (Codrington 1909) අතීත අවස්ථාවක් සිහියට නංවයි.

මෙකී ශිල්ප කර්මාන්තයන් කරගෙන යාමේදී ඒ සඳහා උපයුක්ත අමුද්‍රව්‍ය සහ එකී අමුද්‍රව්‍ය ලබාගත් ප්‍රදේශ පිළිබඳ ගැබ්ව ඇති අදහස් පැරණි ශ්‍රිලංකාවේ සම්පත් පරිහරණය සහ භූවමාරු රටාව පිළිබඳ කදීම ලෙස චිත්‍රණය කරන අවස්ථාවක් ලෙස පෙන්වා දිය හැකිය. මෙහි දැක්වෙන අමුද්‍රව්‍ය අතර තඹ, බටලී, රත්‍රන්, රිදී, පිත්තල, යකඩ, සඳුන් ලී, කපු, මැටි, මැණික් සහ සාදිලිංගම් ආදිය අඩංගු වෙයි. එහිම කර්මාන්තයන්හි විශේෂ කාර්යන් සිදුකරීමට සපයා ගත් අමුද්‍රව්‍ය පිළිබඳවද සඳහන් කිරීමට *සීහළවත්ථුප්පකරණයේ* කතුවරයා අමතක කර නැත. නිදසුන් ලෙස කුඹල් කර්මාන්තයේදී මැටි ඇනීම සඳහා  හරක් හම් යොදා ගැනීම,[3] හරකුන්ගේ නහර තූර්ය භාණ්ඩ කර්මාන්තයේදී වීණාවන්හි තත් නිර්මාණයට [4] යොදාගැනිම ගැන වූ යෙදුම් පෙන්වා දිය හැකිය. මෙම සඳහන් මැටි කර්මාන්තය සහ සංගීත භාන්ඩ නිර්මාණය හා සබැඳි අතීත ශිල්ප තාක්ෂණික විධික්‍රම පිළිබඳ විද්‍යමාණ කරයි. මැටි කර්මාන්තයේදී මැටි පදම්කිරීමට හරක්හම් භාවිතය වත්මන් සමාජයෙන් ගිලිහී ඇති අවධියක එහි අතීත ඉසව් මෙලෙස සොයාගත හැකිවීම වැදගත් තත්වයකි. සාම්ප්‍රදායික සංගීත භාණ්ඩ නිර්මාණය කරන්නාවූ ශිල්ප ගම්මාන වන උඩුනුවර හොඩියාදෙණිය සහ පාතදුම්බර මැණික්හින්න වාසය කරන ශිල්පීන් ගවයින්ගේ ශරීර කොටස් ස්වකීය නිර්මාණකරණය උදෙසා භාවිතය චිරාත් කාලයක් පුරාවට සාම්ප්‍රදායික උරුමයේ සාම්‍යතා ප්‍රකට කරයි. සාදිලිංගම් අලංකරණ ක්‍රමවේදයේ උපයුක්ත අමුද්‍රව්‍යයක් වන අතර *සහස්සවත්ථුප්පකරණය* ද මීට සමාන්තරව සිරියල් පිළිබඳ දක්වා ඇත (*සහස්සවත්ථුප්පකරණං*, 1959: කථාවස්තුව 13, පි. 23). මේවා ශිල්පකලා හා බැඳි තාක්ෂණික ක්‍රමවේදයන් පිළිබඳ අපවෙත සපයන වටිනා සාක්ෂි ලෙස ඉහළට මතුකළ හැකිය. රත්‍රන් ලබාගත් ප්‍රදේශ ලෙස සුවර්ණ භූමි[5] ප්‍රදේශය පෙන්වා දීමෙන් අදාළ අමුද්‍රව්‍ය පදනම් කරගෙන ප්‍රදේශයන් නාමකරණයට ලක්වීම ඇත අතීතයේ පටන් පැවති බව තහවුරු කරයි.

---

3 ...*කුම්භකාරො ආගන්ත්වා තස්ස ජීවන්තසසෙ චම්මං උප්පාටෙත්වා මත්තිකාමද්දනත්ථාය ගතො*... ( *සීහළවත්ථුප්පකරණං*, 1959: කථාවස්තුව 4, පි. 15)

4 ...*ගන්ධබ්බො ආගන්ත්වා නහාරූනි ඵාලෙත්වා ගහෙත්වා ගතො වීණාතන්තිකරණත්ථාය*... (එම)

5 *සුවණ්ණවණ්ණබුද්ධස්ස සොණ්ණථූපං කරොමහං සුවණ්ණභූමිං ගන්ත්වාන සුවණ්ණං ආහරෙය්‍යහං* (*සීහළවත්ථුප්පකරණං*, 1959: කථාවස්තුව 34, පි. 92)

*සීහළවත්ථුප්පකරණය* තුළ පැරණි ජන සමාජයේ දෛනික දිවිපෙවෙතට අවැසි මෙවලම් රාශියක් අන්තර්ගතව ඇති අයුරු පහත සඳහන් අයුරින් උපුටා දැක්විය හැකිවේ.

රෙදිපිළි : තුන්සිවුරු, සඟල සිවුරු, නානකඩ, බඳපටි, කම්බිලි, කම්බිලි පලස්, වාහන ඇතිරිලි, ඇඳ ඇතිරිලි, කොඩි.

ගේදොර, ආගමික උපකරණ : පියන සහිත කළය, කිරි මුට්ටි, ධමකරකය, පැන් කළය, සැලි, පාත්‍රය, රන්තලිය, මෝලගස, වංගෙඩිය, බත් කන භාජන, ලෝහ භාජන, ඇඳුම් දමන පෙට්ටි

කෘෂි උපකරණ : දෑකැත්ත, නගුල, නගුල්තලය, වැය, පොරව

පූජ්‍ය වස්තු : මිණි මුතු යෙදූ බුද්ධ රූප, රන්කරඬු

ආභරණ : රාජාභරණ, ඔටුන්න, මැණික් බැඳි ඔටුන්න, නම සහිත මුද්ද, රජ දුවකගේ ආභරණ, රජ බිසවකගේ ආභරණ, සිංහ ලකුණ සහිත කඩුක්කම

ලෝහ භාණ්ඩ : තහඩු, ලෝහ තහඩු, යකඩ තහඩු, යතුරු කඩුල්ල

ආයුධ : කඩු මිටි, ශස්ත්‍රය, කිරිච්චිය

දැව භාණ්ඩ : ඇඳ, රත් සඳුන් පුටුව, හාන්සි පුටු

සංගීත භාණ්ඩ : තාලම්, වීනා, බටනලා, බෙර

ඉහත නිදර්ශන අතර ගෘහ උපකරණ සහ ගොවි උපකරණ විශාල ප්‍රමාණයක් වේ. අතීතයේ කෘෂිකාර්මික දිවිපෙවෙතක් ගත කළගැමි ජනසමාජයක ශිල්පකලාවන්ගේ උපයෝගිතාව මෙම ග්‍රන්ථය කෙරෙන් කදිමට චිත්‍රණය වේ.

*සීහළවත්ථුප්පකරණයේ* අන්තර්ගත ශිල්පකලාවන්හි ශ්‍රම විභජනය පිළිබඳ සලකාබලන කල්හි එහි විවිධතා කිහිපයක්ද හඳුනාගත හැකිය. මෙම කර්මාන්ත බොහෝවිට ගෘහකර්මාන්ත ලෙස වර්තමානයේද ලංකාවේ ක්‍රියාත්මකව පවතින අතර එහි අතීත ස්වරූප ද ඊටම සමගාමී විලාසයක් පෙන්නුම් කළ බව මෙම මූලාශ්‍රයේ අන්තර්ගත තොරතුරු මගින් අනුමාන කළ හැකිය. බොහෝ විට ශිල්පීන් කර්මාන්තයේ නිරතවන අතර එකම කර්මාන්තයේ නිරතවන ශිල්පින් අතර නායකයන් සහ ප්‍රධානීන් හඳුනාගත හැකිය.

පුරාණ සමාජයේ ශිල්පකලාවන්හි පිරිමියා පමණක් නොව කාන්තාවද දායකවූ බව ඓතිහාසික සාහිත්‍ය මූලාශ්‍ර මගින් හෙළිවන කරුණකි (Munasinghe 1991). *සීහළවත්ථුප්පකරණය* ද මෙම පුරාතත්ත්වය පිළිබඳ ඉඟි සපයන ග්‍රන්ථයක් ලෙස පැවසිය හැකිය (කරුණාරත්න 2008:190). *මහාවංසය* රුවන්වැලි සෑය

ඉදිකිරීමට ශ්‍රම දායකත්වය සැපයූ කාන්තවන් පිළිබඳ[6] සඳහන් කරත්දී පැරණි ත්‍රිපිටක සාහිත්‍යයේ කාන්තාවන් ස්වකීය ස්වාමියාගේ ගෘහකර්මාන්තවල ශිල්පීය ප්‍රාගුණ්‍යයක් දැක්විය යුතු බව සහ අතීත බෞද්ධ සාමාජයේ කාන්තාව එසේ සිය ශ්‍රම දායකත්වය ලබා දෙමින් තම කාර්ය විවිධ අංශ ඔස්සේ ඉටුකළ අයුරු උග්ගහ සූත්‍ර අටුවාව මගින් පැහැදිලි වේ. එහිදී නිදසුන් ලෙස එළුලොම් විවීමේ කර්මාන්තය සහ කපු කැටීමේ කර්මාන්තය පෙන්වා දී තිබේ. එළුලොම් භාවිතයෙන් කරන කර්මාන්තයේදී ඒවා අවුල් හැරීම, සෝදාපිරිසිදු කිරීම, සායම් දැමීම හෙවත් පඬු පෙවීම, ගෙතීම හෝ මිටි බැඳීම ආදියද කපු කැටීමේ කර්මාන්තයේදී පුළුන් ඒ මේ අත පෙරළීම, ඇඹරීම, තැලීම හෝ ගසා දැමීම සහ නූල් කැටීම ආදී ඒ ඒ කර්මාන්තයේ ආරම්භයේ සිට අවසානය දක්වා ඒ ඒ දක්‍ෂභාවය තිබිය යුතය[7]. ඛුද්දක නිකායේ උදාන පාලියේ[8] පවා කාන්තාව ස්වාමියාගේ කර්මාන්ත උදෙසා සහයවීම පිළිබඳ තොරතුරු අනාවරණය කරයි. *සීහළවත්‍ථුප්පකරණය* සිය පියාගේ ගඩොළු කර්මාන්තය සහය වෙමින් ශිල්පකාලවන්හි නිරතවන දියණියක්[9] කාන්තා දායකත්වය පිළිබඳ ඉඟියක් අපට ලබාදෙයි (කරුණාරත්න 2008:189). ශිල්පීන් වියපත් වූ පසුව ද විශ්‍රාම නොගොස් කර්මාන්තයේ නියළීම[10] කතාන්තර තුළ අන්තර්ගතවීම මගින් අදටත් මහනුවර අවට දැන වෙවුලන වියපත් ශිලිපීන් සිය සිත ගත මෙහෙයවා සිදුකරන විචිත්‍ර සියුම් කලාවන්ගේ මහිමය අපවෙත සිහිගන්වයි.

වර්තමාන සමාජයේ මෙම ශිල්පකලාවන් ඔස්සේ එළිදකින නිම්භාණ්ඩ රුපියල් සත මත තීරණය වුවද හුවමාරු පද්ධතියක් කෙරෙහි හුරුවූ අතීත ජනසමාජය තමා ලබාගන්නා භාණ්ඩ වෙනුවෙන් තමන් නිපදවන භාණ්ඩයක් හෝ ශිල්පියාගේ මහන්සියට සරිලන්නට ශිල්පියාගේ දෛනික ජීවිතයට අවැසි බඩු බාහිරාදිය, ශිල්පයට අවශ්‍ය අමුද්‍රව්‍ය රැගෙන යාමේ පුරුද්දක් පැවති බව *සීහළවත්‍ථුප්පකරණය* අනාවරණය කරයි. ස්වකීය කර්මාන්ත කිරීමට අවශ්‍ය ගොවියෙක් තම ගොවි උපකරණ තනා ගැනීමට කම්මල්කරුවා වෙත

---

6"...මෙහි ම බැල මෙහෙ කොට ස්ත්‍රියෝ දෙදෙනෙක් තව්තිසා දෙව්ලොව උපන්නෝ මහසෑය නිමකළ දෙදෙන පූර්ව කර්ම ආවර්ජනා කොට කම් පල දුටුවාහු ගඳමල් ගෙන සෑය පුදන්නාහු..." (*මහාවංසය* 1967: පරි.30 ගාථා44-45).

7 "*එළකලොමානං විජටනධොවනරජන වෙණිකරණාදීසු කප්පාසස්ස ච වට්ටනපිඤ්ජන(පිසන) පොටනකන්තනාදීසු ඡෙකො භවිස්සාම*" (*මනෝරථපූරණී*, 2 භාගය, 598 පි.)

8"...හේ පෙහෙර වෙසක් මවාගෙන හූ කටියි. **අසුර දූ සුජා තොමෝ නඩාව (පිළී වියන සිරස් දණ්ඩ) පුරාලයි...**" (කාශ්‍යප සූත්‍රය,
*උදාන පාළි, ඛුද්දක නිකාය* 01, 1960: 187 පි).

9 "*...එකො කස්සකො කපණො අහු, ධීතා ච අත්තනො එකා ඉට්ඨකම්මෙන ජීවති*"
(*සීහළවත්‍ථුප්පකරණං*, 1959:45 කථා වස්තුව
121 පි.)

10 "*...නවකම්මික -මහල්ලකො අයං...*" (එම:කථා වස්තුව 82, පි.169)

පැමිණෙනුයේ පඬුරු පිණිස ඇල් හාල්, ඌරුමස්හා වේවැල් කරටි රැගෙනය[11]මෙය අතීත සමාජවල ක්‍රියාත්මක වූ බාටර් ක්‍රමයේම [Barter Systerm භාණ්ඩයකට භාණ්ඩයක් හුවමාරු කිරීම (Davies 2002) ] එක් ස්වරූපයක් ලෙස හඳුනාගත හැකිය. එය අද පවා වැදි සමාජයේ ක්‍රියාත්මක වන චාරිත්‍රයකි. තමන්ට අවශ්‍ය ඊතල නිපදවා ගන්නට අසල්වැසි ගම්මානයේ කම්මල්කරුවා වෙත මීපැණි සහ මස් ආදිය රැගෙන ගොස් තම ඊතල නිපදවාගැනීම *සීහළවත්ථුප්පකරණයේ* සඳහන් ඇල් හාල්, ඌරුමස් හා වේවැල් කරටි රැගෙන යාම හා සමගාමී තත්වයක් ලෙසින් පෙන්වාදිය හැකිය.

සමාජයේ විවිධ චාරිත්‍රවාරිත්‍ර උදෙසා ශිල්ප භාවිතය පිළිබඳ විමසීමේදී පුද්ගලයෙකු මියගියවිට වස්ත්‍රයකින් වැසීම [12] රෙදිපිළිකර්මාන්තයේ සමාජ උපයෝගිතාව පිළිබඳ එක් පැතිකඩක් පෙන්නුම් කරයි. යහසාමාජීය කටුයුතුවල නිරත වීමෙන් රාජකීයයන්ගේ ප්‍රසංසාව ලත්විට ත්‍යාග පිරිනැමීමේ සිරිතක් පැවත් බවත්, නිමි භාණ්ඩ ත්‍යාග ලෙස ලබන්නට සමාන්‍ය ජන කාන්තාවන්ට අවස්තාව ලත් අයුරු ද *සීහළවත්ථුප්පකරණය* පවසයි. මෙහිදී රජ දියණියකගේ ආභරණ, රජ බිසවකගේ ආභරණ ත්‍යාග ලෙස ලැබීම නිදසුන්ලෙස පෙන්වා දිය හැකිය.

එක් එක් ශිල්පයන්හි සැරසිලි සහ අලංකරණ පිළිබඳ දැක්වීමේදී ඒවා විවිධ මෝස්තර යොදා අලංකාර කළ අයුරු මෙම ග්‍රන්ථය තුළවිස්තර වේ. රන් ආභරණවල යෙදූ සිංහ කැටයම් [13] ලෝහ කැටයම් [14] එම ශිල්පකලාවන්ගේ අලංකරණ ක්‍රියාවලිය පිළිබඳ පැතිකඩක් නිරූපණය කරයි.

පශ්චාත් මධ්‍යකාලීන සමාජයේ සමාජ සංවිධානය තුළ මෙම කාර්මික කුලයන් දැඩි ලෙස ආන්තිකකරණය වුවද අතීත සමාජයේ සමාජභාවය පිළිබඳ සෙවීමේදී බොහෝ වෙනස් තත්ව අපවෙත අනාවරණය වේ.

ශිල්පීන් පිරිසක් සිටින විට ඒ අය අතර ප්‍රධානියෙකු සිටිබවත් අන්‍ය කර්මාන්තකරුවන් විවිධ ද්‍රව්‍ය රැගෙන ඔහු බැහැදැකීමට යාමේ පුරුදු සහ එසේ යනවිට විවිධ බඩු බාහිරාදිය රැගෙන යාම ගැන තම්බසුමන තෙරුන්ගේ කථාවේ

---

[11] ...*අඤ්ඤතරො කම්මාරකම්මෙ ඡෙකො කම්මතෙ විසාරදො ජාතො. අඤ්ඤතරො කසිකම්මකාරකො කසිපරික්ඛාරානි, කාරෙතුකාමො සාලිතණ්ඩුලං සූකරමංසං වෙත්තග්ගං ච ගහෙත්වා තස්ස කම්මාරස්ස පණ්ණකාරත්ථං ආනයි*... (*සීහළවත්ථුප්පකරණං*, 1959: කථා වස්තුව7, පි. 26)

[12] ...*කිං මයා කාතබ්බං, තුය්හං සරීරං පටිච්ඡාදෙතුං අඤ්ඤං නත්ථීති*... (*සීහළවත්ථුප්පකරණං*, කථා වස්තුව 69, පි. 157)

[13] ...*සීහකුණ්ඩලමුත්තමං*... (එම:කථා වස්තුව42, පි. 112)

[14] ...*ලොහොකම්මෙන සංයුත්තං*... (*සීහළවත්ථුප්පකරණං*:කථා වස්තුව 23, පි. 66)

දක්ෂ ලෝකුරුවෙකුට අන්‍ය කම්මල්කරුවන් විසින් ගිතෙල් මුට්ටියක් සහ ඇල්හාල් මුට්ටියක් ත්‍යාගලෙස ගෙන යාමෙන් තහවුරු වේ.[15] මෙම ශිල්පීන් නුවණැති පිරිසක් ලෙස සඳහන් අවස්ථාද වේ (*සීහළවත්‍ථුප්පකරණං* 1959: කථා වස්තුව 7, පි. 27). මෙවැනි ශිල්පීන් ආගමික පුදපූජාවන්හි නිරතවූ බව පූර්වබ්‍රාහ්මී අභිලේඛණ තුලින්[16] ද අනාවරණය වෙයි. ශිල්ප පවුලට අයත් පුද්ගලයින් උදෙසා පැවිදිවීමට අවැසි ආගමික නිදහස පැවති බවත් පැවිදිවූ පසුවද ස්වකීය ශිල්පය සම්බන්ධවන නම් භාවිතයත් [17] තම්බසුමන තෙරුන්ගේ කථාව (*සීහළවත්‍ථුප්පකරණං*, කථාවස්තුව 44, පි. 119) තුළින් තහවුරු කරයි. භික්ෂූන්වෙත දන්දීමේදී පාත්‍රයට යටින් වස්ත්‍රයක් තැබීම (එම: කථාවස්තුව 8, පි.34), රජ අනක් උදෙසා නිමකළ බඳුනක් පිළිගැන්වීමේදී එය වස්ත්‍රයකින් වසා පිළිගැන්වීම, රන්තලිය නිමකරන රන්කරුවෙක් එය වස්ත්‍රයකින් ඔතා පිළිගැන්වීමෙන් පෙනීයයි (එම: කථාවස්තුව 40, පි.108). විහාරස්ථාන වෙත කරන ලද පුදපූජා අතර මහාසෑයට රෙදිවලින් කරන ලද කොඩි සාදා පුදපූජා පැවැත්වීම (එම: කථාවස්තුව 43, පි.118) අවස්ථා ගණනාවකදීම ඉදිරිපත් වේ.

සමාජයේ විවිධ ස්ථර අතර පැවති විසමතා සහ වරප්‍රසාදයන් ශිල්පකලාවන් කෙරෙන් නිරූපණයවීම සඳහා ද සැලකිය යුතු දත්ත *සීහළවත්‍ථුප්පකරණය* තුළ අන්තර්ගතය. රජ පවුලේ අය භාවිත මෙවලම් සාමාන්‍ය පවුල්වල සාමාජිකයන් භාවිත නොකළ බව මෙහි රාජකීයයෙකු විසින් සාමාන්‍ය කාන්තාවකගෙන් ධාන්‍ය හුවමාරුවක් සඳහා තමා කුණ්ඩලය ලබා දෙනුයේ එහි වූ සිංහ ලකුණ ගලකින් තලා දමමින්ය [18]. අතීත සමාජයේ විවිධ සමාජ ස්ථර වෙත කලා නිර්මාණ සැපයීමේදී අදාළ නිර්මාණයේ අලංකරණාංග තීරණය කිරීමට අදාළ භාණ්ඩය කවරෙකු විසින් පරිහරනය කරන්නේද යන්න මගින් තීරණය වී ඇති බව මෙමගින් පෙනේ. ආභරණ යනු, සමාජ තත්ත්වය පෙන්වීමේ සංකේතයක් වූ නිසාවෙන් රාජකීය ආභරණයක් සාමාන්‍ය ජන සමාජයේ සමාජිකයෙකු අත පත්වීමෙන් සිදුවන අවභාවිතයක් වැළැක්වීමටද රාජ ආභරණය ත්‍යාගයක් ලෙස ලබා දීමට පෙර එහිවූ සිංහ සංකේතය ගලකින් තලා නොපෙනෙන ලෙස සැකසීමෙන් පෙනේ. රජ දුවක සහ රජ බිසවකගේ ආභරණ ලෙස වෙනමම සඳහන්වීම, රාජකීය හෝ ප්‍රභූ පැලැන්තිය ද ඔවුන්ගේ බලය වයස සහ තනතුරු

---

[15] ...*අනුරාධපුරෑතෙතමෙ ලොහකම්මෙසු කුසලො විස්සුතො කම්මකාරකො තස්සෙව කම්මකාරස්ස අඤ්ඤෙ කම්මඨ්ඨොනරො සතං ච සාලිකුට්ටං ච ආනෙසි පණ්ණකාරකං... සීහළවත්‍ථුප්පකරණං*, 1959:කථා වස්තුව44, පි. 119)

[16] ***මණිකර*** *මුලගුතහ පදගඩිනි* (74) මිහින්තලේ ආනෛකුට්ටිකන්ද, අනුරාධපුර දිස්ත්‍රික්කය (*Inscriptions of Ceylon*, Vol. I, Part I: 1970:06)

[17] ...*තම්බසුමනතෙථෙරොති තම්බපණ්ණිමහි පාකටො...* (*සීහළවත්‍ථුප්පකරණං*, 1959: කථා වස්තුව44, පි. 119)

[18] ...*කණ්ණතො ඔමුඤ්චිත්වාන සීහකුණ්ඩලමුත්තමං පාසාණෙ කොට්ටයිත්වාන අදාසිං තාය ඉත්‍ථියා...* (එම : කථා වස්තුව 42, පි.112)

ආදීය පදනම් කරගෙන ඊට යෝග්‍යවූ හෝ තම තත්ත්වය බාහිර ලෝකයට සංකේතාත්මකව ප්‍රකාශයට පමුණුවන්නාවූ වෙන්වූ ආභරණ උක්ත සමාජයේ පැවතීම පිළිබඳ කදිම විවරණයකි.

සමහර අවස්වල ශිල්පයන්හි නිරත කාර්මිකයන් ආර්ථික අපහසුතාවලට මුහුණ දුන් අයුරු ගඩොල් කැපීමේ කර්මාන්තයේ නිරතවූ පියාට ඉන් ප්‍රමාණවත් මුදලක් උපයාගැනීමට නොහැකිවූ අවස්ථාවලදී තම දියණිය පවා උකසට තැබීමට සිදුවූ අයුරුද ගඩොල් කර්මාන්තය සිදුකොට කහවණු අටක් ඉතිරි කරගැනීමට ගතවන කාලය අවුරුදු සතක් තරම් දීර්ඝවීමත්[19] අතීත සමාජයේ ශිල්පින් විඳි නේකවිද ගැටලු පිළිබඳ පරාවර්තනයක් වැන්න.

ශිල්පකලාවන් පිළිබඳ විවිධ තත්ව විමර්ශනය කිරීමේදී ඒ හා බැඳි අභිචාර විස්වාස බොහෝසෙයින් අන්තර්ගතව පවතී. ඒ අතර ශිල්පකලාවන් හා විශ්වකර්ම දෙවියන් අන්‍යෝන්‍ය වශයෙන් බැඳිපවතී. *මහාවංශය* විවිධ අවස්ථාවල *විශ්වකර්මයා* (1967: පරි.18 ගාථා24-29) කර්මාන්තවල නිරතවූ අයුරු පෙන්වාදේ. එහිම අනුරාධපුරයේ ශිල්පවලට අධිපති කම්මාර දෙවියන් පිළබඳවද (*එම*, පරි. 15 ගාථාව 203) පවසයි. *සීහළවත්ථුප්පකරණයේ* කතුවරයාද විශ්වකර්ම පිළිබඳ[20] සඳහන් කිරීම ශිල්පකලාවන් හා මෙම දෙවියන්ගේ සබඳතාව චිරාත්කාලයක් පැවතගෙන එන විශ්වාසයක් බව තවදුරටත් සනාථ කරන්නකි.

මේ අයුරින් ගොනුකළ තොරතුරු අනුව තත්කාලීන ජනසමාජයේ ප්‍රචලිත වූ ජනකථා සමූහයක් තුළින් උක්ත සමාජයේ ක්‍රියාත්මකවූ විවිධ ප්‍රාග් කාර්මික ශිල්පයන්, එහි නිරතවූ ශිල්පීන්, ශිල්ප ගම්මාන, අමුද්‍රව්‍ය, නිමැවුම්, ශ්‍රම විභජනය, හුවමාරු ක්‍රම, සිරිත් විරිත්, සමාජ ස්ථරායනය සහ අගමික විශ්වාස පිළිබඳව සැලකිය යුතු දත්ත ප්‍රමාණයක චිත්‍රණයක් ඓතිහාසික මූලාශ්‍රයක් වූ සීහළවත්ථුප්පකරණය හරහා පැමිණෙන බව පෙන්වා දිය හැකිය. හැඳින්වීමේදී ද සඳහන් කළ පරිදි මෙහි අන්තර්ගත තොරතුරු මහා සම්ප්‍රදායේ මූලාශ්‍රවලින් ඔබ්බට නොලියවුණු ඉතිහාසයක තතු අපවෙත සපයා දෙන ජනමූලාශ්‍රයක් ලෙස *සීහළවත්ථුප්පකරණයේ* අගය අවධාරණය කළ හැකි ය.

---

[19] ...*එවං සො ජීවමානොපි දුබ්භික්ඛෙ ජාතපීළිතො කහාපණානමඩ්ඪනං ධීතං අභි ඉණං කතං කහාපණෙ නික්ඛිපිත්වා, එකවීසතිමාණිකං සාමං ගහෙත්වා සො කාමං ඉඩ්කම්මං උපඩ්ඪීතො සො තං කම්මං කරිවාන අඩ්ඪ ලද්ධං කහාපණෙ සත්තවස්සානි පූණ්ණානි*.... (*සීහළවත්ථුප්පකරණං*: කථා වස්තුව 45, පි.121)

[20] ...*පඤ්චමුඛකූටාගාරං විසුකම්මං නිම්මාපෙත්වා* ... (*සීහළවත්ථුප්පකරණං*, 1959: කථා වස්තුව 67, පි.154)

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


*උදාන පාළි*, ඛුද්දක නිකාය 1 (1960), බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා 24, කොළඹ: ලංකා ආණ්ඩුව මගින් ප්‍රකාශිතයි.

*දීපවංසය* (1959), සංස්. කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

*මනෝරථපූරණී* (1931), 2 භාගය, කොළඹ: සයිමන් හේවාවිතාරණ සංස්කරණ.

*මහාවංශය* (1967), සංස්. හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි සහ දොන් අන්ද්‍රියෙස් ද සිල්වා බටුවන්තුඩාව, කොළඹ: රත්නාකර පොත් වෙළඳ ශාලාව.

*රසවාහිනී* (1983), සම්පාදක එල්. ගුණරත්න, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.

*වංසත්ථප්පකාසිනී* (1994), සිංහල අනුවාදය අකුරටියේ අමරවංශ නාහිමි සහ හේමචන්ද්‍ර දිසානායක, කැළණිය විශ්ව විද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය.

*සහස්සවත්ථුප්පකරණය* (1999), සංස්. වෑගම පියරතන හිමි. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

*සිංහල ථූපවංසය* (1966), සංස්. බලගල්ලේ විමලබුද්ධි ස්ථවිර සහ විමල විජේසූරිය. කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.

*සිංහල බෝධිවංශය* (1970), සංස්. නන්දසේන රත්නපාල. කොළඹ: ප්‍රදීප ප්‍රකාශකයෝ.

*සීහලවත්ථුප්පකරණං* (1959), සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි. කොළඹ: ත්‍රිපිටක මුද්‍රණාලය.

*සීහලවත්ථුපකරණය* (ඉතා පැරණි සිංහළ බණ කථා) (1959), සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.

*Inscriptions of Ceylon*, Vol. I, Part I, (1970), Ed. S. Paranavitana, Colombo: Department of Archaeology.

කරුණාරත්න, දුල්මා (2008), *ක්‍රි. ව. 1වන සියවසේ සිට 12වන සියවස අවසානය දක්වා ශ්‍රී ලංකාවේ ඓතිහාසික කලා නිර්මාණයන්හි නිරූපිත කාන්තාව: සමාජ-පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්*, පුරාවිද්‍යා දර්ශනපති උපාධි නිබන්ධනය. පේරාදෙණිය විශ්වවිද්‍යාලය (අප්‍රකාශිත).

Coomaraswamy, A.K. (1906), Some survivals in Sinhala art, *J.R.A.S.* (Ceylon Branch) 19, number 57, 72-93.

Coomaraswamy, A.K. (1908), *Mediaeval Sinhalese Art: Being a Monograph on Mediaeval Sinhalese Arts and Crafts, Mainly As Surviving in the Eighteenth Century, with an Account of the Structure of Society and the Status of the Craftsmen*, Broad Campden: Pantheon Book.

Codrington, H.W. (1909). Kandyan Navandanno, *Journal R.A.S.* (Ceylon) 30, number 62, 221-253.

Davies, G. (2002). *History of Money: From Ancient Times to the Present Day,* Cardife: University of Wales Press.

Munasinghe, I. (1991). *Sri Lankan Women in Antiquity: $6^{th}$ Century B.C. to Fifteenth Century A.C.*, Colombo: S. Godage & Brothers.

Seneviratne, S. (1995), 'The Ecology and Archaeology of the Seruwila copper magnetite prÈpect northeast Sri Lanka',*The Sri Lanka Journal of the Humanities*, Vol. 21 (1-2), University of Peradeniya, Sri Lanka.